දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ද්විතීය භාග (බාහිර) පරීක්ෂණය - 2013 මාර්තු

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) PART II – MARCH 2013

# සවිසා 3.1 - සංවර්ධන සමාජ විද්‍යාව

# SGYG 3.1 - Sociology of Development

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.)

---

01. සංවර්ධනය යනු කුමක්දැයි හඳුන්වා සංවර්ධනය මිණුම් කිරීමේ දී ආර්ථිකමය නිර්ණායක පමණක් යොදා ගැනීමේ ඇති සීමාකම් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

02. "සංවර්ධනය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති නවීකරණ න්‍යාය (Modernization Theory) සර්ව සාධාරණ නොවේ" මේ ප්‍රකාශයට ඔබ එකඟ වන්නෙහි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

03. ග්‍රාම සංවර්ධනයේ අරමුණු පැහැදිලි කර, නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ග්‍රාම සංවර්ධන වැඩසටහන් එම අරමුණු ඉටුකරලීමට කොතෙක් දුරට දායක වී ඇත්දැයි ප්‍රායෝගික නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

04. සංවර්ධනය පිළිබඳ එමිල් ඩර්කයිම් (Emil Durkheim) හා මැක්ස් වෙබර් (Max Weber) ගේ අදහස් සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න.

05. "නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ දිළිඳුබව පිටු දැකීමේ වැඩසටහන් (Poverty Reduction Programs) හැමවිටම සාර්ථක වී නැත" මේ ප්‍රකාශය සමඟ ඔබ කොතෙක් දුරට එකඟ වන්නෙහි දැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

06. තෙවන ලෝකයේ රටවල ඌන සංවර්ධනය කෙරෙහි බලපා ඇති හේතු නව මාක්ස්වාදීන් (Neo-Marxists) දෙදෙනෙකුගේ අදහස් ඇසුරින් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

07. රටක සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දී දේශීය (පාරම්පරික) ඥානයේ (Indigenous Knowledge) ඇති වැදගත්කම ප්‍රමාණය කරන්න.

08. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.
    - i. සංවර්ධනය මිණුම් කිරීමේ සමාජීය දර්ශක (Social Indicators)
    - ii. පරාධීන න්‍යාය (Dependency Theory)
    - iii. ටැල්කොට් පාසන්ස් (Talcott Parsons)
    - iv. සුභසාධක ප්‍රවේශය (Welfare Approach)

❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖